# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1986 අංක 14 දරන
# ඉඩම් ප්‍රතිසංස්කරණ
# (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1986 ජූනි මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1986 ජූනි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.20 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1986 අංක 14 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත

එල්. ඩී—ඕ. 11/83

[සහතිකය සටහන් කළේ 1986 ජූනි මස 20 වන දින]

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සහ 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සහ ඇතැම් නියම හා නිශ්චයන් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන සැලැස්වීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1986 අංක 14 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

### I වන කොටස

### ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සංශෝධනය කිරීම

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (මින් මතු මේ පනතේ මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(2) මේ උපවගන්තිය පනවනු ලැබූ දිනයට පසු දිනයක, විවාහය නිසා හෝ උරුම වීම නිසා නැතහොත් ඒ දෙකම නිසා යම් තැනැත්තකු උපරිමයට වැඩි කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක අයිතිකරු බවට පත් වන අවස්ථාවක, (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු අතර, ඒ තැනැත්තා විසින්, ඔහු ඒ කෘෂිකාර්මික ඉඩමේ අයිතිකරු බවට පත්වූ දිනයේ සිට අවුරුදු දෙකක කාලසීමාවක් ඇතුළත එසේ උපරිමයට වැඩි ඉඩම් ප්‍රමාණය විකිණීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ පවරා දෙනු ලැබිය හැකිය. ඒ කාලසීමාව ඇතුළත උපරිමයට වැඩි එම ඉඩම් ප්‍රමාණය පවරා දීම ඒ තැනැත්තා විසින් පැහැර හරින ලද අවස්ථාවක, උපරිමයට වැඩි එම ඉඩම් ප්‍රමාණය ඒ කාලසීමාව අවසාන යේ දී—

(අ) කොමිෂන් සභාව වෙත සතු වූ ලෙස සැලකිය යුතු ය ; තවද,

(ආ) කොමිෂන් සභාව විසින් දෙන ලද ව්‍යවස්ථාපිත බද්දක් යටතේ ඒ තැනැත්තා විසින් තම සන්තකයෙහි තබා ගෙන සිටින ලෙස සැලකිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (ආ) ඡේදය අත් හැරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1—ඒ 089737—6,925 (86/04)

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියෙහි (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආ) (අ) ඡේදය යටතේ බදු ගැනුම්කරුට තබා ගැනීමට අවසර දෙන ලද කෘෂිකාර්මික ඉඩම සම්බන්ධයෙන්—

(i) සර්වේයර්-ජනරාල් විසින් හෝ ඔහුගේ මෙහෙයවීම යටතේ ; හෝ ;

(ii) මිනින්දෝරු අධිකාරිවරයකුගේ තත්ත්වයට නොඅඩු තන තුරක් දරන මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරි යකු විසින් අනුමත කරන ලද්දාවූද මිනින්දෝරු ආඥාපනත යටතේ බලය ලද්දාවූද මිනින්දෝරුවරයකු විසින් ; හෝ

අඳින ලද මිනින්දෝරු පිඹුරකට යොමු කිරීමක් විය යුතුය. තවද, ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආආ) ඡේදයෙහි "විකිණීමෙන්" යන වචනය වෙනුවට "විකිණීමෙන් හෝ බදු දීමෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් වෙත, කෘෂි කාර්මික ඉඩම් අන්සතු කිරීම නො කළ යුතු බව.

23. මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පැවරුනු කිසිදු කෘෂිකාර්මික ඉඩමක්, ශ්‍රී ලංකාවේ පුරවැසි නොවන තැනැත්තකු වෙත අන්සතු කිරීම, කොමිෂන් සභාව විසින් නොකරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) අනුඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) (අ) තේ, රබර් හෝ පොල් වගා කරන ලද කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් වූ විට, ඒ කෘෂිකාර්මික ඉඩම කොමිෂන් සභාව සතු වූ දිනයට පෙරාතුවම වූ ගිණුම් වර්ෂ තුන සඳහා ඒ කෘෂිකාර්මික ඉඩමේ

නිෂ්පාදනයේ පවතින අක්කරයකට ලැබුණු සාමාන්‍ය වාර්ෂික ඵලදාව පදනම් කර ගෙන ගණන් බලන ලද මුදලක් ; එහෙත් ඒ කෘෂිකාර්මික ඉඩමේ අක්කර යකට සාමාන්‍ය වාර්ෂික ඵලදාව, මෙහි I වන තීරයේ දක්වා ඇති ප්‍රමාණයට සමාන වන අවස්ථාවල දී, නිෂ්පාදනයේ පව තින ඒ කෘෂිකාර්මික ඉඩම් එක් එක් අක්කරයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල, මෙහි II වන තීරයේ අනුරූප සට හනෙහි දක්වා ඇති මුදලට සමාන මුද ලක් විය යුතුය. ".

| I තීරය<br>අක්කරයක සාමාන්‍ය වාර්ෂික ඵලදාව | II තීරය<br>අක්කරයක් සඳහා වන්දි මුදල් ප්‍රමාණය<br>රු. |
|---|---|
| තේ | |
| රාත්තල් 1,500 කට වැඩි ... ... | 2,500 |
| රාත්තල් 1,000 ට වැඩි එහෙත් රාත්තල් 1,500 ට නොවැඩි ... | 2,000 |
| රාත්තල් 750 ට වැඩි එහෙත් රාත්තල් 1,000 ට නොවැඩි ... | 1,500 |
| රාත්තල් 750 ක් සහ ඊට අඩු ... ... | 1,000 |
| රබර් | |
| රාත්තල් 1,000 ට වැඩි ... ... | 2,500 |
| රාත්තල් 750 ට වැඩි එහෙත් රාත්තල් 1,000 ට නොවැඩි ... | 2,000 |
| රාත්තල් 500 ට වැඩි එහෙත් රාත්තල් 750 ට නොවැඩි ... | 1,500 |
| රාත්තල් 500 ක් සහ ඊට අඩු ... ... | 1,000 |
| පොල් | |
| ගෙඩි 3,000 ට වැඩි ... ... ... | 2,500 |
| ගෙඩි 2,000 ට වැඩි එහෙත් ගෙඩි 3,000 ට නොවැඩි ... | 2,000 |
| ගෙඩි 2,000 ක් හා ඊට අඩු ... ... | 1,500 ; හෝ |

(ආ) කොකෝවා, කුරුඳු, ගම්මිරිස්, වී හෝ වෙන යම් කෘෂිකාර්මික නිෂ්පාදනයක් වගා කරනු ලැබූ කෘෂිකාර්මික ඉඩමක් සම්බන් ධයෙන් වන විට නිෂ්පාදනයේ පවතින ඒ කෘෂිකාර්මික ඉඩමේ එක් එක් අක්කරය සඳහා රු. 2,000 බැගින් ගණන් බලනු ලැබූ මුදලක් ;

(ඇ) කෘෂිකාර්මික ඉඩම කොමිෂන් සභාව වෙත සතු වූ දිනයෙහි වගා කිරීම හෝ නැවත වගා කිරීම හෝ සඳහා සූදානම් කර තිබුණු එහෙත් ඒ දිනයේ දී යම් කෘෂිකාර්මික බෝගයක් වගා කොට හෝ නැවත වගා කොට හෝ නොමැති කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් වූ විට, ඒ කෘෂිකාර්මික ඉඩමේ එක් එක් අක්කරය සඳහා රු. 1,000 බැගින් ගණන් බලනු ලැබූ මුදලක් ;

(ඈ) කෘෂිකාර්මික ඉඩම කොමිෂන් සභාව වෙත සතු වූ දිනයේ මෙහි I වන උපලේඛනයේ සඳහන් කිසියම් කෘෂිකාර්මික බෝගයක් වගා කොට හෝ නැවත වගා කොට හෝ තිබුණු එහෙත් ඒ දිනයේ දී නිෂ්පාදනයේ නොපවතින යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් වූ විට, ඒ කෘෂිකාර්මික ඉඩමේ එක් එක් අක්කරය සඳහා මෙහි II වන තීරුවේ අනුරූප සටහනෙහි දක්වා ඇති ප්‍රමාණය අනුව ගණන් බලන ලද මුදලක් ;

| I තීරය<br>කෘෂිකාර්මික නිෂ්පාදනය | II තීරය<br>අක්කරයකට ප්‍රමාණය<br>රු. |
|---|---|
| වී ... ... ... ... | 1,000 |
| තේ ... ... ... ... | 1,000 |
| රබර් ... ... ... ... | 1,000 |
| පොල් ... ... ... ... | 1,500 |
| කොකෝවා, කුරුඳු, ගම්මිරිස්, හෝ වෙනත් යම කෘෂිකාර්මික නිෂ්පාදනයක් ... ... ... | 2,000 |

(ඉ) වගා නොකරන ලද කෘෂිකාර්මික ඉඩම් සම්බන්ධයෙන් වන විට, ඒ කෘෂිකාර්මික ඉඩමේ එක් එක් අක්කරය සඳහා රු. 75.00 බැගින් ගණන් බලනු ලැබූ මුදලක්. " ; තවද,

(ආ) එම උපවගන්තියේ (ඇ) ඡේදයෙහි I වන තීරය සහ II වන තීරය යටතේ පිළිවෙලින් ඇති " වී " සහ " රු. 2,500 " යන යෙදුම් අත් හැරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (3) කොමිෂන් සභාව වෙත සතු කරනු ලැබූ දිනයට පෙරාතුවම වූ දිනයෙහි යටත් පිරිසෙයින් අවුරුදු පහලොවක් නොගෙවී ඉතිරිව ඇති කාලසීමාවක් සහිත බද්දකට යටත් ව තිබුනු සහ කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල, මේ පනතේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඒ බද්ද යටතේ වූ බදුකරු සහ බදුලාභියා අතර සියයට හතළිහට සියයට හැට යන අනුපාතය අනුව කොටස් කර බෙදිය යුතු ය :

එසේ වුවද ඒ කෘෂිකාර්මික ඉඩමේ බදුලාභියා විසින් එහි යම් ගොඩනැගිල්ලක් ඉදිකර ඇති අවස්ථාවක, ඒ ගොඩනැගිල්ලේ වටිනාකම ගැන සැලකිලිමත්ව, මෙම උපවගන්තිය අනුව බදු ලාභියාට කොටස් කර බෙදා ඇති කොටස කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් සාධාරණ වූ ප්‍රමාණයකින් වැඩි කළ යුතු ය. ".

(2) (1) වන උපවගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, සියලු කාර්ය සඳහා, ප්‍රධාන ප්‍රඥප්තිය ආරම්භ වූ දින සිට ක්‍රියාත්මක වී ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, මෙම වගන්තියේ (1) වන උපවගන්තිය මගින් ඇතුළත් කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 31 (3) වන වගන්තියෙහි සඳහන් කරනු ලැබ ඇති යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන්, එම උපවගන්තියේ එසේ ඇතුළත් කරන ලද විධිවිධාන අනුව ගෙවනු ලැබූ යම් වන්දි මුදල් ප්‍රදානයක් නීත්‍යානුකූලව ගෙවනු ලැබ ඇති ලෙස සහ ගෙවනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 ඌ වගන්තිය පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ:— (ප්‍රධාන ප්‍රඥප්තියේ 42 ඌ වගන්තිය සංශෝධනය කිරීම.)

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම, පහත දක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (අඅ) අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව කෘෂිකාර්මික නොවන කාර්යයන් සඳහා විකිණීමෙන් හෝ බදු දීමෙන් පවරා දීම ; " තවද,

(ආ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (1අ) වතු ඉඩම්වල නිෂ්පාදනය වැඩි කිරීමේ සහ ඒවායේ රැකියා බිහි කිරීමේ අවශ්‍යතාව ගැන සැලකිලිමත්ව, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන කාර්ය සඳහා, (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (අඅ) ඡේදය හෝ යටතේ වූ බද්දක් මගින් අක්කර පණහකට වැඩි වතු ඉඩම්, කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකු වෙත පවරා දීම නීත්‍යානුකූල වන්නේ ය. ".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 ඒ වගන්තිය පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ:— (ප්‍රධාන ප්‍රඥප්තියේ 42 ඒ වගන්තිය සංශෝධනය කිරීම.)

(අ) ඒ වගන්තියේ (2අ) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනුඡේදය ඉවත් කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන අනු ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ii) (අ) තේ, රබර් හෝ පොල් වගා කරන ලද වතු ඉඩමක් සම්බන්ධයෙන් වූ විට, ඒ වතු ඉඩම් කොමිෂන් සභාව සතු වූ දිනයට පෙරාතුව ම වූ ගිණුම් වර්ෂ තුන සඳහා ඒ වතු ඉඩමේ නිෂ්පාදනයේ පවතින අක්කර ප්‍රමාණයෙන්, අක්කරයකට ලැබුණු සාමාන්‍ය

වාර්ෂික එලදාව පදනම් කරගෙන ගණන් බලන ලද මුදලක්; එහෙත් ඒ වතු ඉඩමේ අක්කරයක සාමාන්‍ය වාර්ෂික එලදාව, මෙහි I වන තීරයේ දක්වා ඇති ප්‍රමාණයට සමාන වන අවස්ථාවල දී ඒ වතු ඉඩමේ නිෂ්පාදනයේ පවතින එක් එක් අක්කරය සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල, මෙහි II වන තීරයේ අනුරූප සටහනෙහි දක්වා ඇති මුදලට සමාන මුදලක් විය යුතුය :—

| I තීරය<br>අක්කරයක සාමාන්‍ය වාර්ෂික එලදාව | II තීරය<br>අක්කරයක් සඳහා වන්දි මුදල් ප්‍රමාණය<br>රු. |
|---|---|
| තේ | |
| රාත්තල් 1,500 කට වැඩි ... ... | 2,500 |
| රාත්තල් 1,000 ට වැඩි එහෙත් රාත්තල් 1,500 ට නොවැඩි | 2,000 |
| රාත්තල් 750 ට වැඩි එහෙත් රාත්තල් 1,000 ට නොවැඩි ... | 1,500 |
| රාත්තල් 750 ක් සහ ඊට අඩු ... ... | 1,000 |
| රබර් | |
| රාත්තල් 1,000 ට වැඩි ... ... | 2,500 |
| රාත්තල් 750 ට වැඩි එහෙත් රාත්තල් 1,000 ට නොවැඩි ... | 2,000 |
| රාත්තල් 500 ට වැඩි එහෙත් රාත්තල් 750 ට නොවැඩි ... | 1,500 |
| රාත්තල් 500 ක් සහ ඊට අඩු ... ... | 1,000 |
| පොල් | |
| ගෙඩි 3,000 ට වැඩි ... ... ... | 2,500 |
| ගෙඩි 2,000 ට වැඩි එහෙත් ගෙඩි 3,000 ට නොවැඩි ... | 2,000 |
| ගෙඩි 2,000 ක් හා ඊට අඩු ... ... | 1,500 ; හෝ |

(ආ) කොකෝවා, ගම්මිරිස්, කුරුඳු, වී හෝ වෙනත් යම් කෘෂිකාර්මික නිෂ්පාදනයක් වගා කරනු ලැබූ වතු ඉඩමක් සම්බන්ධයෙන් වූ විට, නිෂ්පාදනයේ පවතින ඒ වතු ඉඩමේ එක් එක් අක්කරය සඳහා රු. 2,000 බැගින් ගණන් බලනු ලැබූ මුදලක් ;

(ඇ) වතු ඉඩම කොමිෂන් සභාව වෙත සතු වූ දිනයෙහි වගා කිරීම හෝ නැවත වගා කිරීම හෝ සඳහා සූදානම් කර තිබුණු එහෙත් ඒ දිනයේදී යම් කෘෂිකාර්මික බෝගයක් වගාකොට හෝ නැවත වගා කොට හෝ නොමැති යම් වතු ඉඩමක් සම්බන්ධයෙන් වූ විට, ඒ වතු ඉඩමේ එක් එක් අක්කරය සඳහා රු. 1,000 බැගින් ගණන් බලනු ලැබූ මුදලක් ;

(ඈ) වතු ඉඩම කොමිෂන් සභාව වෙත සතු වූ දිනයෙහි මෙහි I වන තීරයේ සඳහන් කිසියම් කෘෂිකාර්මික බෝගයක් වගා කොට ඇත්තා වූ ද එහෙත් ඒ දිනයේ දී නිෂ්පාදනයෙහි

නොපැවතියා වූද යම් වතු ඉඩමක් සම්බන්ධයෙන් වූ විට, ඒ වතු ඉඩමේ එක් එක් අක්කරය සඳහා මෙහි II වන තීරයේ අනුරූප සටහනෙහි දක්වා ඇති ප්‍රමාණය අනුව ගණන් බලන ලද මුදලක් :—

| I තීරය<br>කෘෂිකාර්මික නිෂ්පාදනය | II තීරය<br>අක්කරයකට ප්‍රමාණය<br>රු. |
|---|---|
| වී ... ... ... ... | 1,000 |
| තේ ... ... ... ... | 1,000 |
| රබර් ... ... ... ... | 1,000 |
| පොල් ... ... ... ... | 1,500 |
| වෙනත් යම් කෘෂිකාර්මික නිෂ්පාදනයක් ... ... | 2,000 |

(ඉ) වගා නොකරන ලද වතු ඉඩම් සම්බන්ධයෙන් වූ විට, ඒ වතු ඉඩමේ එක් එක් අක්කරය සඳහා රු. 75.00 බැගින් ගණන් බලන ලද මුදලක්." ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ I වන තීරය සහ II වන තීරය යටතේ පිළිවෙළින් දැක්වෙන "වී" සහ "රු. 2,000" යන යෙදුම් අත් හැරීමෙන් ;

(ඇ) ඒ වගන්තියේ (ඇ) ඡේදයෙහි "යම් වතු ඉඩමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල්" යන වචනවල සිට, "රුපියල් දෙදාස් පන්සීය නොඉක්මවිය යුතුය" යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"යම් වතු ඉඩමක් සම්බන්ධයෙන්, මේ උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව ආගණනය කරන ලද වන්දි මුදලක් ගෙවනු ලැබීමට කැමැත්ත දක්වන කිසිම තැනැත්තකු (මේ උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඒ තැනැත්තාට හිමිකම් ඇති යම් අතිරේක මුදලක් එසේ ආගණනය කරන ලද වන්දි මුදලට එකතු කිරීමෙන් පසුව සහ මේ උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ අඩු කිරීමට අවශ්‍ය යම් මුදලක් එසේ ආගණනය කරන ලද වන්දි මුදලෙන් අඩු කිරීමෙන් පසුව) ඒ වතු ඉඩමේ එක් එක් අක්කරය සඳහා රුපියල් දෙදහස් පන්සීයට වැඩි මුදලක් නොගෙවනු ලැබිය යුතුය." ;

(ඈ) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(5) මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව වෙත සතු වූ වතු ඉඩම් සම්බන්ධයෙන් සහ එම වතු ඉඩම් වෙනුවෙන් වන්දි

ගෙවීම සම්බන්ධයෙන්, 29 වන වගන්තියේ සිට 40 වන වගන්තිය දක්වා (ඒ වගන්ති දෙකම ඇතුළුව) වූ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**11.** 59 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ වගන්තිය ලෙස බල පැවැත්විය යුතුය :—

"කොමිෂන් සභාව වෙත සතු වූ ඉඩම්වලට කාලාපගමන ආඥාපනත අදාළ නොවිය යුතු බව.

59අ. කිසිම තැනැත්තකු විසින්, කොමිෂන් සභාව වෙත සතු වූ යම් කෘෂිකාර්මික ඉඩමක හෝ වතු ඉඩමක හෝ සන්තකය දැරීමෙන් හෝ එම ඉඩම ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ එවැනි යම් ඉඩමක කිසියම් කාලාපගමන අයිතියක් අත්කර ගැනීම කරනු නොලැබිය යුතු අතර, එම තැනැත්තා විසින් ශත වර්ෂයකින් තුනෙන් එකකට වැඩි කාල සීමාවක් සඳහා නිර්බාධිත වූ ද අඛණ්ඩ වූ ද ප්‍රතිවිරුද්ධ සන්තකය ඔප්පු කරනු ලැබුවහොත් මිස, කාලාපගමන ආඥාපනත හෝ, සන්තකය දැරීම නැතහොත් ප්‍රයෝජනයට ගැනීම ප්‍රකාර අයිතිය අත්කර ගැනීමට අදාළ වෙනත් යම් නීතියක් හෝ එවැනි යම් ඉඩමක් කෙරෙහි අදාළ නොවිය යුතු ය.".

## II වන කොටස

## 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතට සංශෝධන

1981 අංක 39 දරන පනතේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** (1) මේ පනතේ මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතේ 18 වන වගන්තියේ (6) වන උපවගන්තියේ "ඒ ආඥාව කරන ලද දිනයේදී නැත හොත්" යන වචනවල සිට, ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"එවැනි ආඥාවකට හෝ වෙනස් කරන ලද, සුළු වශයෙන් වෙනස් කරන ලද නැතහොත් සංශෝධනය කරන ලද යම් ආඥාවකට හෝ අනුකූලව කරන ලද යම් පැවරීමක් ඒ කෘෂිකාර්මික ඉඩම සම්බන්ධයෙන් අයිතිය, හිමිකම හා සම්බන්ධතාව පැවරුම් ලාභියා වෙත පැවරීමක් ලෙස බලපැවැත්විය යුතු ය.".

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙහි සිට ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පනත දැක්වෙන උපවගන් තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) 1971 මැයි මස 29 වන දින හෝ ඉන් පසු ව එහෙත් 1972 අගෝස්තු මස 26 වන දිනට පෙර ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබුවා වූ ද, එසේ අත්කර ගනු නොලැබුවේ නම්, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ කොමිෂන් සභාව වෙත සතු විය හැකිව තිබූ හොවූද, මේ පනත ආරම්භ වන දිනයෙහි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 17 වන වගන්තිය යටතේ ප්‍රදානයක් කරනු ලැබ නොමැත්තා වූ ද ඉඩම් කිසිවක්, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබ ඇති අවස්ථාවක, මේ පනතෙහි හෝ වෙනත් යම් නීතියක හෝ කුමක් සඳහන්ව ඇත ද, ජාතික රාජ්‍ය සභාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් කොමිෂන් සභාව වෙත සතු වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ පනතේ 14 වන වගන්තිය හෝ 19 වන වගන්තිය හෝ යටතේ ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුවකුගේ අයිතිවාසිකම්වලට ඒ ඉඩම්වල අයිතිකරුවන් හිමිකම් ලැබිය යුතුය ; තවද මේ පනත ආරම්භ වන දින සිට මාස තුනක් ඇතුළත ඒ අයිතිකරුවන් විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තිය යටතේ සහ ජාතික රාජ්‍ය සභාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත ව්‍යවස්ථාපිත ප්‍රකාශයක් කරනු ලැබිය හැකි ය.".

## III වන කොටස

### ඇතැම් නියමයන් වලංගු කිරීම

14. ජාතික රාජ්‍ය සභාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ (2) වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් සංශෝධනය කරමින්, අමුතු කරමින් හෝ වෙනස් කරමින් ජාතික රාජ්‍ය සභාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ, 1977 සැප්තැම්බර් මස 1 වන දිනයෙන් පසුව සහ 1981 ජූනි මස 3 වන දිනට පෙර අමාත්‍යවරයා විසින් කරන ලද (මේ වගන්තියෙහි "අමුතු කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) සෑම නියමයක් ම— 1977 සැප්තැම්බර් මස 1 වන දින සහ 1981 ජූනි මස 3 වන දින අතර ජාතික රාජ්‍ය සභාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 13 (3) වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද ඇතැම් නියමයන් වලංගු කිරීම.

(අ) ජාතික රාජ්‍ය සභාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් කාල සීමාව ඉකුත් වීමෙන් පසු අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද ආයාචනයක් මත ඔහු විසින් අමුතු කිරීමේ නියමය කරනු ලැබ තිබීමේ ; හෝ

(ආ) කොමිෂන් සභාවේ නියමයට විරුද්ධව ඒ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද ආයාචනයක් ජාතික රාජ්‍ය සභාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කලින් ප්‍රතික්ෂේප කර තිබීමේ

හේතුව නිසාම පමණක් බලරහිතව තිබුණේ යයි හෝ බල රහිත වේයැයි හෝ සලකනු නොලැබිය යුතුය.

ජාතික රාජ්‍ය සභාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තිය යටතේ ඉඩම් පැවරීම සඳහා වූ ඇතැම් අනුමත කිරීම් වලංගු කිරීම.

15. (1) කිසියම් කෘෂිකාර්මික ඉඩමක් පැවරීම සඳහා අනුමතය දෙමින් කොමිෂන් සභාව විසින් 1977 සැප්තැම්බර් මස 1 වන දිනයෙන් පසුව සහ 1981 ජූනි මස 3 වන දිනයට පෙර, ජාතික රාජ්‍ය සභාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 (2) වන වගන්තිය යටතේ කරන ලද සෑම නියමයක් ම සහ එවැනි යම් නියමයකට අනුව සිදු කරන ලද සෑම පැවරීමක් ම—

(අ) එම අනුමතය දෙනු ලැබූ දිනයේ දී 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතේ 18 වන වගන්තියේ විධිවිධාන බලාත්මකව පැවතියාක් මෙන් ; සහ

(ආ) 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතේ 18 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ආයාචනයක් මත ඒ ඉඩම පැවරීම සඳහා අනුමතය දෙමින් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 (2) වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නියමයක් කර ඇත්තාක් මෙන්,

අවස්ථාවෝචිත පරිදි, වලංගු ලෙස කරන ලද ලෙස හෝ ක්‍රියාත්මක කරන ලද ලෙස සහ වලංගු ලෙස කර ඇතැයි හෝ ක්‍රියාත්මක කර ඇතැයි සලකනු ලැබිය යුතු ය.

(2) ජාතික රාජ්‍ය සභාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් සංශෝධනය කරමින්, අමුතු කරමින් හෝ වෙනස් කරමින් 1977 සැප්තැම්බර් මස 1 වන දිනට පසුව සහ 1981 ජූනි මස 3 වන දිනට පෙර ඒ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද (මේ උපවගන්තියෙහි "අමුතු කිරීමේ නියමයන් යනුවෙන් සඳහන් කරනු ලබන") සෑම නියමයක් ම සහ එවැනි අමුතු කිරීමේ යම් නියමයකට අනුව සිදු කරන ලද යම් කෘෂිකාර්මික ඉඩමක සෑම පැවරීමක් ම—

(අ) ඒ අමුතු කිරීමේ නියමය කරන ලද දිනයේ 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතෙහි 18 වන වගන්තිය බලාත්මකව පැවතියාක් මෙන් ; සහ

(ආ) 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතේ 18 වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය හෝ යටතේ අමාත්‍යවරයා වෙත කරන ලද ඉල්ලීමක් මත අමාත්‍යවරයා විසින් ඒ පනතෙහි 18 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ ඒ අමුතු කිරීමේ නියමය කරනු ලැබුවාක් මෙන්

අවස්ථාවෝචිත පරිදි, වලංගු ලෙස කර ඇති ලෙස හෝ ක්‍රියාත්මක කර ඇති ලෙස සහ වලංගු ලෙස කර ඇතැයි හෝ ක්‍රියාත්මක කර ඇතැයි සලකනු ලැබිය යුතු ය.

**16.** කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකු සම්බන්ධයෙන් කරන ලද ව්‍යවස්ථාපිත නිශ්චයන් පිළිබඳව 1977 සැප්තැම්බර් මස 1 වන දිනයෙන් පසුව සහ 1981 ජූනි මස 3 වන දිනට පෙර කොමිෂන් සභාව විසින් කරන ලද සෑම අවලංගු කිරීමක් ම සහ ඒ තැනැත්තා සම්බන්ධයෙන් ඒ කාලසීමාවෙන් පසු කොමිෂන් සභාව විසින් කරන ලද සෑම අලුත් ව්‍යවස්ථාපිත නිශ්චයක් ම— **1977 සැප්තැම්බර් මස 1 වන දින සහ 1981 ජූනි මස 3 වන දින අතර, කරන ලද ඇතැම් ව්‍යවස්ථාපිත තීරණ වලංගු කිරීම.**

(අ) ඒ අවලංගු කිරීම සහ අලුත් නිශ්චය කරන ලද දිනයෙහි 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතේ 19 වන වගන්තිය යටතේ විධිවිධාන බලාත්මකව පැවතියාක් මෙන් ; සහ

(ආ) 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතේ ඉහත කී වගන්තියේ (1 වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ආයාචනයක් මත 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතේ ඉහත කී වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ඒ අවලංගු කිරීම සහ නිශ්චය කරනු ලැබ ඇත්තාක් මෙන්

වලංගු ලෙස කර ඇති ලෙස සහ කර ඇතැයි සැලකිය යුතු ය.

**17.** මේ පනතේ මේ කොටසෙහි— **අර්ථ නිරූපණය.**

"කොමිෂන් සභාව" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අදහස් වේ ;

"ජාතික රාජ්‍ය සභාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 39 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.